අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/9/15/2/3/3/8

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2021.02.11

ලේකම්,
ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය,

**වයස 19න් පහල පාසල් ක්‍රිකට් තරගාවලිය**

ඔබගේ 2021.01.18 දිනැති ලිපිය හා බැඳේ.

එම 2021.01.18 දිනැති ලිපියේ සඳහන් පරිදි වයස 19න් පහල පාසල් ක්‍රිකට් තරගාවලිය, 2021.03.20 සිට2021.05.15 දක්වා පැවැත්වීමට පහත කොන්දේසිවලට යටත්ව අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මෙයින් ලබා දෙමි.

මෙම කොන්දේසි යටතේ තරගාවලිය පැවැත්වීමේ වගකීම ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය විසින් දැරිය යුතු බවද තවදුරටත් දැනුම් දෙමි.

කොන්දේසි

1. තරග පැවැත්වීමට ප්‍රථම තරග කාල සටහන මා වෙත ලැබීමට කටයුතු සැලැස්විය යුතුය.
2. තරගාවලිය පැවැත්වීමේදී රටේ පවතින සෞඛ්‍ය තත්වය පිළිබඳව දැඩි අවධානයක් යොමු කර අධ්‍යාපන ලේකම්ගේ ED/9/15/04/07 හා 2021.01.21 දිනැති සෞඛ්‍යාරක්ෂිත උපදෙස් ලිපියට අනුකූලව තරගාවලිය පැවැත්විය යුතුය.
3. ආගමික නිවාඩු දිනවලදී තරග නොපැවැත්විය යුතුය.
4. තරගාවලිය පැවැත්වීමේදී සිසුවාගේ අධ්‍යාපන කටයුතුවලට මෙන්ම කලාප,පළාත් හා සමස්ත ලංකා පාසල් ක්‍රීඩාවලට බාධාවක් නොවන පරිදි තරග පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කළ යුතුය.යම්කිසි අයුරකින් පාසල් ක්‍රීඩා තරගවලට බාධාවුවහොත් තරගාවලිය අවලංගු කිරීමට සිදුවන බවද දැනුවත් කළ යුතුය.
5. අ.පො.ස.(සා.පෙළ) සහ පාසල් හි වාර පරීක්ෂණ පැවැත්වෙන කාලසීමාවන්හි ක්‍රිකට් ක්‍රීඩා තරග පැවැත්වීම නොකළ යුතු බව තරයේ දන්වමි.
6. තරගයට සහභාගී වන සිසුන්ගෙන් මුදල් අයකර නොගත යුතුය.
7. සහභාගි කරවන සියලුම ළමුන්ට ආරක්ෂාව සැලසෙන පරිදි සියලු කටයුතු සංවිධානය කළ යුතු ය.
8. පාසල් සිසුන්ගේ විනය සුරැකීමේ වගකීම ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ සභාපති විසින් දැරිය යුතු ය.
9. තරගාවලියට පෙර සහභාගී වන සෑම ශිෂ්‍යකුම තම මව,පියා,භාරකරුගෙන් දෙමාපියන්ගෙන් තරගාවලියට දරුවා සහභාගි කරවීමට කැමැත්ත ප්‍රකාශ කළ ලිපියක් අදාළ විදුහල්පතිවරයා විසින් සහතික කර ඉදිරිපත් කල යුතු ය.
10. ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ පාසල් සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබන නීති රීති උල්ලංඝනය නොවන පරිදි තරගාවලිය පැවැත්විය යුතු ය.
11. අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති බව දන්වමින් පාසල් වෙත යොමු කිරීමට සකසන ලබන ලිපියේ,අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපි අංකය හා දිනයද ඇතුළත් කළ යුතුය. එහි පිටපතක් පාසල්වලට යැවීමට ප්‍රථම මා වෙතද එවිය යුතුය.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk